සැ. යු. — 2015.02.20 වැනි දින පළ වූ අංක 1,903 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,904 - 2015 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා - 2015.02.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 528 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 549 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 554 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මාර්තු මස 20 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මාර්තු මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**

රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

527 - B 80924- — 5002 (2015/02 )
F 1 –

# තනතුරු - ඇබෑර්තු

## රිදීගම ප්‍රාදේශීය සභාව

රිදීගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දින හා 2009.05.12 වැනි දින අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය, ප්‍රාථමික අර්ධ ශිල්පීය, ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයට අයත් අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම.

*උපලේඛනය*

| | *තනතුර* | *ශ්‍රේණිය* | *සේවක ගණය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|---|
| 1. | රියදුරු | III | ප්‍රාථමික ශිල්පීය | 03 | රු.12,470-10x130 10 x 145-10 x 160 12 x 170-රු.18,860 (PL3 2006-A) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයන් දෙකකට සම්මාන සහිතව විෂයන් 06ක් වත් සමත්ව තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයන් 05ක් වත් සමත්විය යුතුය.<br><br>02. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය.<br><br>මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දින වනවිට (2009.05.12) ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ, එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>01. තාරබර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br><br>02. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |
| 2. | විදුලි කාර්මික | III | ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | රු.12,210-10x130- 10 x 145-10 x 160 12 x 170-රු.18,600 (PL2 2006-A) | 01. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍යපෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක දින වන විට (2008.11.19) ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ, එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>02. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය.<br><br>මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දින වනවිට (2009.05.12) ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් |

| තනතුර | | ශ්‍රේණිය | සේවක ගණය | පුරප්පාඩු ගණන | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|---|
| | | | | | | පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ, එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br>*වෘත්තීය සුදුසුකම් :*<br>01. (a) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය ලබා ගැනීම.<br>(b) දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසාන සහතික පත්‍ර විභාගය හෝ කාර්මික විද්‍යාලයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ අවසාන පුහුණු සහතිකය ලබා ගැනීම. |
| 3. | මාර්ග කම්කරු | III | ප්‍රාථමික ශිල්පීය නොවන | 08 | රු.11,730-10x120-10 x 130-10 x 145 12 x 160- රු.17,600 | 01. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක දින වනවිට (2008.11.19) ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ, එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 නොඅඩු හා 45ට නොවැඩි අයකු විය යුතු ය. දැනටමත් රාජ්‍ය හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

02. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

03. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කළ ලියවිල්ලකින් සනාථ කළ යුතු ය.

04. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

05. දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයකු නම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

06. රිදීගම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/දීමනා පදනම මත සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලයක් තිබූ බවට සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)

07. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙක් වී දඬුවම් ලැබුවෙක් නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් හා රියදුරු හා විදුලි කාර්මික තනතුර සඳහා නිපුණතාවය පරීක්ෂා කිරීමේ ප්‍රායෝගික පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

*සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

02. රජයේ ප්‍රතිපත්තිවලට ද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, වයඹ පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගවලට ද ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි චක්‍රලේඛ උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

03. තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. සේවය සතුටුදායක වී නම් ද, පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇත්නම් ද, ලබාගත යුතු භාෂා ප්‍රවීණතාවය ලබා ඇත්නම් ද, පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

04. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*ඉල්ලුම් කල යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් 2015.03.10 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම් ප්‍රාදේශීය සභාව, රිදීගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "............................................. (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කල යුතු ය. අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ පූර්ණ බලතල රිදීගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් ඉදිරිපත් කල යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් පිටපත් ඉදිරිපත් කල යුතු ය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ ලිපිය ;
4. මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකයක් ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව, රිදීගම.

2015 ක් වූ පෙබරවාරි මස 05 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභාව,
රිදීගම.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***රිදීගම ප්‍රාදේශීය සභාව***

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ රිදීගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම - 2015*

.......................................................................... තනතුර සඳහා අයදුම් පත්‍රය

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම : ————————————.
(ii) මුලකුරු සමග නම : ————————————.
02. ස්ථිර ලිපිනය : ————————————.
03. දුරකථන අංකය : ————————————.
04. ග්‍රාම නිලධාරි වසම : ————————————.
05. උපන් දිනය : අවුරුද්ද: ————————————. මාසය: ————————————. දිනය : ————————————.
06. ජාතික හැඳුනුම්පත් අංකය: ————————————.
07. ස්ත්‍රී /පුරුෂභාවය : ————————————.
08. විවාහක/අවිවාහක බව : ————————————.
09. රිදීගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර : ————————————.
10. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග : ————————————.
11. අධ්‍යාපන සුදුසුකම් : ————————————.
12. වෘත්තීය සුදුසුකම් : ————————————.
13. වෙනත් සුදුසුකම් : ————————————.
14. සේවා පළපුරුද්ද : ————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

__________________________.

අයදුම්කරුගේ අත්සන.

දිනය : __________________________.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු ................................................. වන මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ......................................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත් ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, පූර්වාසන්න වසර 5 තුළ සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇති බවද, මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

__________________________.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ,
හෝ බලයලත් නිළධාරියාගේ අත්සන.

නම : __________________________.
පදිංචි නාමය: __________________________.
දෙපාර්තමේන්තුව ආයතනය (නිල මුද්‍රාව තබන්න)
දිනය: __________________________.

02-723

---

**තවලම ප්‍රාදේශීය සභාව**

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

තවලම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**උපලේඛනය**

| *තනතුර* | *සේවා ගණය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පලපුරුද්ද* |
|---|---|---|---|---|
| 1. ආදාහනාගාර ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු.12,210-130x10-145x10-160x10-170x12-රු.18,600 (රා. ප. ච. අංක06/2006-(iv) පීඑල්2 -2006-ඒ) | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සමත් වී තිබිය යුතුය.<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබිය යුතුය.<br><br>අදාල ක්ෂේත්‍රයේ පලපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 2. ආදාහනාගාර සහයක | "ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | රු.11,730-120 x 10-130 x 10-145 x 10-160 x 12-රු.17,600 (රා. ප. ච. අංක 06/2006-(iv)PL1-2006-ඒ | අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06ක් සමත් වී තිබිය යුතුය. |

02. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින අයට/උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(iii) අයදුම්පත්භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න දකුණු පළාත තුළ ස්ථිර පදිංචි කරුවකු විය යුතුය. තවලම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් එය සනාථ කළ යුතුය.)
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
(v) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුයි.
(vii) තවලම ප්‍රාදේශීය සභාවේ දැනට අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදෙන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(viii) තණකොළ කපන යන්ත්‍රය භාවිතය, වඩු හා පෙදරේරු වෘත්තීය පිළිබඳ සාමාන්‍ය දැනුමක් ඇති අය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ix) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම තවලම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා සතුය.

03. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් අරමුදල් යටතේ දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීම් දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(iii) මෙම බඳවා ගැනීම් කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද/රජයේ මුදල් රෙගුලාසි වලටද/රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද/දකුණු පළාත් සභාව හෝ තවලම ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය

(i) සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
(iii) සම්මුඛ පරීක්ෂණයෙන් ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවල අනුව පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

05. ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන :

අයදුම්පත සමග පහත සඳහන් සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී එම ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය
(iv) මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකයක්
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
(vi) පලපුරුද්ද පිළිබඳ සහතික
(vii) තවලම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්

06. *අයදුම් කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ දැක්වෙන ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත සකස් කර 2015.03.10 දිනට පෙර "සභාපති, තවලම ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

බන්දුල විජේසේකර,
සභාපති,
තවලම ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 02 වැනි දින,
තවලම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

*තවලම ප්‍රාදේශීය සභාව*

*ආදර්ශ අයදුම්පත්‍රය*

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ ................................................... තනතුර සඳහා බඳවාගැනීම*

01. මුලකුරු සමග නම : ——————————.
(මුලකුරු වලින් හැඳින්වෙන නම්): ——————————.
02. ස්ථිර පදිංචි ලිපිනය: ——————————.
03. උපන් දිනය ඃ වර්ෂය: ——————————. මාසය : ——————————. දිනය : ——————————.
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස ඃ අවුරුදු: ——————. මාස: ——————. දින : ——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය: ——————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය: ——————————.
06. විවාහක/අවිවාහක බව: ——————————.
07. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන් ද? : ——————————.
08. ජාතිය: ——————————.
10. අධ්‍යාපන සුදුසුකම් : ——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

10. වෘත්තීය සුදුසුකම්/සේවා පළපුරුද්ද: ——————————.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ?: ——————————.
12. ඔබ දැනටමත් තවලම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්
(i) දරන තනතුර : ——————————.
(ii) එම තනතුරට පත් වූ දිනය : ——————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (අනියම්/තාවකාලික/ආදේශක කොන්ත්‍රාත් පදනම මත) : ——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව ද මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය : ——————————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ
(රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රජයේ සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම ආයතනයේ ........................ තනතුර දරන .............................. මයා/මිය/මෙනවිය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට යෙදෙන සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් සහතික කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : ——————————.
02-663

## බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

බස්නාහිර පළාතේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන්, පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.03.06 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, පානදුර පර, බණ්ඩාරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *තනතුරු ගණන* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණිය | PL-2-2006A<br>රු. 12,210-130x10-145 x 10-160 x 10-170 x 12-රු. 18,600<br>(ආරම්භක පියවර) | 01 | 01 දෙවරකට නොවැඩි වාර ගණනක දී, අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06කින් සමත්වීම.<br><br>තනතුරට අදාළව වසර 02ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.) |
| 02 | වැඩ ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණිය | PL-1-2006A<br>රු. 11,730-120 x 10-130 x 10-145 x 10-160-12- රු. 17,600<br>(ආරම්භක පියවර) | 01 | 01 දෙවරකට නොවැඩි වාර ගණනක දී අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06කින් සමත්වීම. |

ඉහත සඳහන් කරන ලද තනතුර සඳහා අදාළ සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන පොදු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

01. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015.03.06 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවකු නොවිය යුතු ය.
(v) අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
(vi) ඉල්ලුම් පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුල වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයකු විය යුතු ය.
(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින් තනතුරු සඳහා අයදුම් කිරීමේ දී, රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතු ය.

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය/ශ්‍රේණිගත උසස් වීමක් නම් එක් අවුරුදු 1 ක වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත්විය යුතු ය.
(iii) ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත් දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(iv) මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතන තුල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතුවේ. තව ද පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම් ඒ ඒ පළාත් ආයතනවල ප්‍රධානීන්ගේ එකඟතාවය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කරනු ඇත. රාජකාරි වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියාට රජය පිළිගත් නීති රීතිවලට යටත්ව තීරණය කල හැකි වේ.
(v) මෙම බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද, රජය හෝ පළාත් සභාව හෝ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම් ලාභීන් බැඳී සිටිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

04. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(i) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී, ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය ;
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත ;
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි ;
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි ;
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතක දී ලබා ගත් ග්‍රාමසේවා සහතිකය.

(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්පත් යොමු කරන තනතුර, ගැසට් නිවේදනයේ සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතු ය. අසම්පූර්ණ හා 04 ඡේදයේ I යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු ය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එන්. ඩී. අයි. ස්වර්ණා කේ. පෙරේරා,
ලේකම්,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 02 වැනි දින,
බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව,
පානදුර පාර,
බණ්ඩාරගම.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව***

*.................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග : ——————————————.
02. (මුලකුරුවලින් හැඳින්වෙන නම්): ——————————————.
03. ස්ථිර ලිපිනය: ——————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය: ——————————————.
05. උපන් දිනය : වර්ෂය: ————————————. මාසය : ————————————. දිනය : ————————————.
06. අයදුම්පත් භාර ගන්නා 2015.03.06 වැනි දිනට වයස : අවුරුදු : ——————. මාස: ——————. දින : ——————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය: ——————————————.
08. විවාහක/අවිවාහක බව: ——————————————.
09. ජාතිය: ——————————————.
10. ඔබ දැනටමත් බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් :
දරන තනතුර : ——————————————. සේවා කාලය : ——————————————.
එම පත්වීම ස්ථිර ද/තාවකාලික ද/අනියම් ද/කොන්ත්‍රාත් ද යන වග : ——————————————.
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග: ——————————————.
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.) : ——————————————.
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්: ——————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

____________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත .................... දින සිට ............................ කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කල හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

____________________,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ——————————.
තනතුර : ——————————.
දෙපාර්තමේන්තුව : ——————————.
නිල මුද්‍රාව : ——————————.
දිනය : ——————————.

02-706

---

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම් තාවකාලික ආදේශක සේවකයින් ගැන වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | ආදායම් පරීක්ෂක (III ශ්‍රේණිය) | 01 | MN-1-2006A<br>රු.13,120–10x145–11x170<br>10x240–10x320–රු.22,040 |

*අධ්‍යාපන සුදුසුකම් : <u>සීමිත බඳවා ගැනීම් සඳහා -</u>*

අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට හා ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

*පළපුරුද්ද :* අදාල පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ශ්‍රේණියක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුල කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

*අධ්‍යාපන සුදුසුකම් : විවෘත බඳවා ගැනීම සඳහා -*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම ;

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

02. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

(I) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(II) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුට් වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය.
(III) බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(IV) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(V) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(VI) දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට වයස් සීමාවන් අදාල නොවේ.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අදාල පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(I) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2015.03.09 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, ප්‍රාදේශීය සභාව, අගලවත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(II) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කර " .................තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.

(III) අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය :-

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* පාසලෙන් අස්වීමේ සහතිකය;
*(ඈ)* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
*(ඉ)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

කේ. ආර්. වැලිකඩ,
ලේකම්,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 13 වැනි දින,
අගලවත්ත,
අගලවත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***අගලවත්ත ප්‍රාදේශීය සභාව***

*අගලවත්ත ප්‍රාදේශීය සභාවේ ............................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————,
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:————————,
03. ස්ථිර ලිපිනය:————————,
04. ග්‍රාම නිලධාරී කොට්ඨාසය:————————,

05. දිස්ත්‍රික්කය :—————————,

06. උපන් දිනය : අවුරුද්ද:—————————, මාසය :—————————, දිනය :—————————,

07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2015.03.09) වයස ඃ අවුරුදු:——————, මාසඃ:——————, දින:——————,

08. ස්ත්‍රී/පුරුෂ භාවය:—————————,

09. විවාහක /අවිවාහක ද යන බව :—————————,

10. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් යන වග : —————————,

11. ජාතික හැඳුනුම්පත් අංකය:—————————,

12. දුරකථන අංකය:—————————,

13. අධ්‍යාපන සුදුසුකම් ඃ

අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය ඃ

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් වර්ෂය හා විභාග අංකය ඃ

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

13. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :—————————,

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ආදේශක/අනියම් ලෙස සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :—————————,

*එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග)*

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි නිවැරදි බවට සහතික කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:—————————,

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

.............................................. මහතා/මහත්මිය මෙම ආයතනයේ ................................................ වශයෙන් සේවයේ නියුක්තව සිටියි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

02-845

## මහරගම නගර සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

මහරගම නගර සභාවේ පුරප්පාඩු වී ඇති, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පහත දැක්වෙන තනතුරු සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *තනතුරු හා වැටුප් පරිමාණය :*

(i) වෙළඳසැල් පරිපාලක III
තනතුරු සංඛ්‍යාව 01
මාසික : රු. 13,120 -10x145 - 11x170 - 10x240-10x320-රු.22,040
(MN1-2006A )

*1. සීමිත බඳවා ගැනීම :*

*(අ)* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත්වී තිබිය යුතුය.)

සහ

*(ආ)* පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය.

*(ඇ)* තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

*(ඇ)* බඳවා ගැනීමේ ක්‍රමය :
ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් | 100 | 40% |

ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

(ii) වැඩ/ක්ෂේත්‍ර පරිපාලක III
තනතුරු සංඛ්‍යාව 03
මාසික : රු. 13,120 -10x145 - 11x170 - 10x240-10x320-රු.22,040
(MN1-2006A )

*1. සීමිත බඳවා ගැනීම :*

*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත්වී තිබිය යුතුය.)

සහ

*(ආ)* පළාත් පාලන ආයතනයක PL-1 හා PL-2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහ (05) ක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය.

*(ඇ)* තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඈ) *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්‍ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණයක් | 100 | 40% |

ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

iii. රියදුරු III ආ
තනතුරු සංඛ්‍යාව 04
මාසික රු. 12,470 -10x130 - 10x145 - 10x160-12x170-රු.18,860
(PL 3-2006-A )

1. *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විභාගයෙන් සාමාර්ථ දෙකක් සහිත විෂයයන් 06ක් සමත් වීම (එක් වරක දී අවම වශයෙන් විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය.

*වෘත්තීය සුදුසුකම් :*

(අ) පෞද්ගලික /කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතුය ;

(ආ) වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුයි.) ;

(ඇ) අවම වශයෙන් උස අඩි 05ක් විය යුතුය;

(ඈ) දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය;

(ඊ) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :-* රා.ප. චක්‍රලේඛ 24/95 විධිවිධාන අනුව බඳවා ගැනීම සිදු කෙරේ.

02. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකිකයන් විය යුතුයි,

(ii) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය,

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය,

(iv) අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

03. *අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :*
අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකයේ පිටපත,
(ii) අධ්‍යාපන සහතික පිටපත්,
(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් තබන ලද ග්‍රාම සේවා සහතිකයේ පිටපත,
(iv) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතයි. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ.
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර උසස් කරනු ලබන සේවකයින් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසි වලට ද, ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හෝ රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනයට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධානවලට ද, මහරගම නගර සභාව විසින් වරින් වරට නිකුත් කරන ලද හා නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

04. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ) සකස් කරන ලද අයදුම්පත් 2015.03.19 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය.
(3) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.
(4) ඉහත සඳහන් කොන්දේසිවලට අනුව නියමිත පරිදි ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර දී මෙම නිවේදනය සංශෝධනය කිරීම අවලංගු කිරීම හෝ බඳවා ගැනීම, ප්‍රමාද කිරීමේ පූර්ව බලය මහරගම නගර සභාවේ ලේකම් සතුවේ.

කේ. ටී. ගම්ලත්,
ලේකම් *(වැ.බ.)*,
මහරගම නගර සභාව.

2015 පෙබරවාරි මස 10 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම*

*මහරගම නගර සභාව*

——————*තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම:——————————,
02. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————,
03. ස්ථිර ලිපිනය:——————————,
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————,
05. දුරකථන අංකය:——————————,
06. ජාතික හැඳුනුම්පත් අංකය:——————————,
07. උපන් දිනය: අවුරුද්ද:————, මාසය:————, දිනය:————,

08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————, මාස:——————, දින:——————,

09. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————,

10. විවාහක/අවිවාහක බව:——————————,

11. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද?:——————————, ලියාපදිංචි වීමෙන්ද යන වග ?:——————————,

12. අධ්‍යාපන සුදුසුකම් : (සහිතකවල පිටපත් ඇමිණිය යුතු ය.)
අ.පොස. (සා.පෙළ විභාගය)
(I) සමත් වර්ෂය හා විභාග අංකය :——————————,

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| *1.* | | |
| *2* | | |
| *3.* | | |
| *4.* | | |
| 5. | | |

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| *6.* | | |
| *7.* | | |
| *8.* | | |
| *9.* | | |
| 10. | | |

(II). අවසන් වරට සමත් වූ ශ්‍රේණිය/වසර :——————————,

13. වෙනත් සුදුසුකම් :——————————,

14. සේවා පළපුරුද්ද:——————————,
13.1 දැනට සේවය කරන ආයතනය :——————————,
13.2 දැනට දරන තනතුර :——————————,
13.3 එම තනතුරට පත්වූ දිනය :——————————,
13.4 මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————,

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මවිසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————,

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ----------------------------මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ --------------------වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර ඔහු/ඇය විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ
අත්සන.

දිනය:——————,
පදවි නාමය හා ආයතනය:——————,

02-738

## කළුතර ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු

කළුතර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම - මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු ගණන* | *අධ්‍යාපන සුදුසුකම් - අභ්‍යන්තර* | *අධ්‍යාපන සුදුසුකම් - බාහිර* | *වෙනත්* | *වැටුප් පරිමාණය* | *බඳවා ගැනීම* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ආදායම් පරීක්ෂක III | 03 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාව සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුය) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම; සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. | (අභ්‍යන්තර අයදුම්කරුවන්) *පළපුරුද්ද :* අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.<br><br>(බාහිර අයදුම්කරුවන්) *පළපුරුද්ද :* අදාළ නැත. | (MN -1-2006-A) රු. 13,120 -10x145 - 11x170 - 10x240-10x320- රු.22,040<br><br>1 වන කාර්යක්ෂමතා කඩඉම 111 ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර (ලිඛිත පරීක්ෂණය) | සියළුම අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය විය යුතු අතර එම පරීක්ෂණයේ දී ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.<br><br>*ලිඛිත පරීක්ෂණයේ විෂයයන් :* අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය - උපරිම ලකුණු ප්‍රමාණය 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br>*සාමාන්‍ය දැනීම* - උපරිම ලකුණු ප්‍රමාණය 100 සමත් ලකුණු ප්‍රමාණය 40%<br><br>පුරප්පාඩු පිරවීමට පෙර මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලබන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට ද භාජනය කරනු ලැබේ. (මෙහිදී ලකුණු ලබාදෙනු නොලැබේ.) |

*02. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-*

(i) ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 30 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(iii) බස්නාහිර පළාත තුළ යටත් පිරිසෙයින් අවුරුදු 03 ක ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතු ය.
(iv) කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(v) යහපත් චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.
(vii) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු නොලැබූ අයෙකු විය යුතු ය.
(viii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
(ix) කළුතර ප්‍රාදේශිය සභාවේ දැනට අනියම් ආදේශක, ව්‍යාපෘති කොන්ත්‍රාත් (වැඩ ඒකක) සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
(x) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර කාලසීමාවේ දී බස්නාහිර පළාතේ මෙම තනතුරුවලට අදාළ නව බඳවාගැනීමේ පටිපාටි ව්‍යවස්ථා සංශෝධනය වීම සහ ව්‍යවස්ථා ආදේශ කිරීමද, බඳවා ගැනීම් ප්‍රමාද කිරීම, වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළුතර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ. ස්ථිර සේවකයින් අවුරුදු 01 ක වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

(iv) මෙම බඳවාගැනීම් කොන්දේසිහි රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, /රජයේ මුදල් රෙගුලාසිවලට ද, /රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද බස්නාහිර පළාත් සභාව හෝ කළුතර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කෙරෙන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා තිබිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික,

(iii) ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත,

(iv) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය,

(v) මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (මින් 1 ක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

(vi) පළපුරුද්ද පිළිබඳ සහතිකය,

(vii) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

05. *අයදුම්කළයුතු ආකාරය* :-

27. රේස් ඔට්ටු එකතු කිරීමේ ස්ථානයක් (බෙට්ං සෙන්ටර්) පවත්වාගෙන යාම
28. රේස් බයි රේස් ඔට්ටු අල්ලන ස්ථානයක් පවත්වාගෙන යාම

02-725/4

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 09.05 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහ පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

09.05.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂයේ දී පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම මත එහි II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* රු. ශත |
|---|---|
| I (i) මෝටර් රථයක්, ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ සෑම වාහනයක් සඳහා | 25 0 |
| (ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක්, හෝ කරත්තයක් සඳහා, | |
| (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (iii) සෑම කරත්තයක් සඳහා | 20 0 |
| (iv) සෑම අත් කරත්තයක් සඳහා | 10 0 |
| (v) සෑම ජින් රික්ෂෝවක් සඳහා | 7.50 |
| (vi) සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවෙකු සඳහා | 15 0 |
| (vii) සෑම ඇතෙකු සඳහා | 50 0 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

02-725/5

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී තීරණ අංක 09.06 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

09.06.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ I වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2014 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2015 වර්ෂය සඳහා පිළිගැනීමටත්,

තවද, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමෙන් සියයට හය (6%) ක වරිපනමක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්; සහ ඒ වරිපනම් එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු මස 31, ජූනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන කාර්තු හතර තුළ දී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් රජ්ගම ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

**උපලේඛනය**

| *බද්දට යටත්වන ප්‍රදේශය* | *වාර්ෂික වටිනාකම % ගණන* |
|---|---|
| 1. රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (රජ්ගම උපකාර්යාල වලින් කොටසක් හා වේරගොඩ උපකාර්යාල සීමාවලින් කොටසක්) නේවාසික | 6% |

02-725/6

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

ප්‍රචාරක දැන්වීම් - දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා
2015 වර්ෂය

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 09.07 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (i) හා 126 (vii) වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව, 1988.08.23 දින අංක 520/7 දරන පළාත් පාලන අතුරු ව්‍යවස්ථා *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදුව රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවල 30 වැනි ඡේදය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අයකිරීමට රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

1. යම් තැනැත්තෙකු විසින් උසුලාගෙන යනු ලබන හෝ ගමන් කරන වාහනයකට සවිකොට ඇති හෝ මහජනතාවට දැක ගැනීමට හැකි වන පරිදි යම් තැනක සවිකර තිබෙන ප්‍රචාරක බැනරයක් සඳහා මසකට එක් වර්ග අඩියකට රු. 20 බැගින් ද,
2. ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා කිසියම් ස්ථානයක සවිකිරීම සඳහා වර්ග අඩියකට රු. 100 බැගින් ද,
3. ගොඩනැගිල්ලක, බිත්තියක හෝ තාප්පයක පින්තාරු තීන්තෙන් ප්‍රචාරක දැන්වීමක් ඇඳ තැබීම සඳහා එක් වර්ග අඩියකට රු.40 බැගින් ද වේ.

02-725/7

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 09.08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

09.08

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණුම් කරනු ලබන අවස්ථාවක එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% ට සමාන මුදලක් බද්ද වශයෙන් විකුණුම්කරු, තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හා අනුයෝජිතයා විසින් ගෙවිය යුතු බවටත්, රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

02-725/8

---

**රජ්ගම ප්‍රාදේශීය සභාව**

ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනත

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක

09.09 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පැවැත්වීමට ඉඩ ඇති පහත උපලේඛනයේ දැක්වෙන සංදර්ශනය වෙනුවෙන් පහත සඳහන් ගාස්තු අයකිරීමට යෝජනා කරන්නීය.

| | | රු. ශත |
|---|---|---|
| 1. | (i) තාවකාලික චිත්‍රපට දර්ශන, මැජික් දර්ශන, සර්කස් දර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනයම් සංදර්ශනයක් සඳහා එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 100 0 |
| | (ii) වැඩිවන සෑම දිනකටම | 50 0 |
| 2. | සංගීත සංදර්ශනයක් සඳහා එක් දිනකට | 200 0 |

02-725/9

---

### රජ්ගම ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා රජ්ගම ක්‍රීඩාංගනය කුලියට දීමේ ගාස්තු

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 09.10 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ඒ වර්ෂයේ මාර්තු මස 30 දිනට පෙර ගාස්තු රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

එක් දිනක් සඳහා පහත සඳහන් ගාස්තු අයකරන බව මෙයින් ප්‍රකාශ කරමි.

### යෝජනාව

1. දේවපතිරාජ විදුහල සඳහා අයකරන මුදලින් 50% ක් එනම් රු. 1,000 ;

2. රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහ රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පාසල්, ක්‍රීඩා සමාජ අනෙකුත් ආයතන සඳහා ගාස්තුව රු. 2,000.

*රගර් ක්‍රීඩාව* :
පාසල්, ආයතන හා ක්‍රීඩා සමාජ සඳහා ගාස්තුව රු. 5,000කි.
ඇප තැන්පතු මුදල 5,000 කි.

අංක 01, 02 වෙන් කිරීම වෙනුවෙන් රු. 3,000 ක ඇප තැන්පතු මුදලක් අය කරනු ලබයි.

02-725/10

---

### රජ්ගම ප්‍රාදේශීය සභාව

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත -477 වැනි අධිකාරය

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 09.11 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

(477 වැනි අධිකාරය වන) සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාසයන්හි තබා ගෙන සිටින සෑම බල්ලෙකු සඳහා රු. 5.00ක් බැගින් ද, සෑම බැල්ලියක සඳහා ම රු. 6.00 බැගින් ද, 2015 වර්ෂයේ සිට අය කිරීමට පනවා ඇති බව රජ්ගම ප්‍රාදේශීය සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙම බදු 2015 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගෙවිය යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02-725/11

---

### රජ්ගම ප්‍රාදේශීය සභාව

පාරිසරික ආරක්ෂණ බලපත්‍රය

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 09.12 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 වන දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

වර්ෂ 2000 අංක 53 දරන පනතින් සහ වර්ෂ 1988 අංක 56 දරන පනතින් සංශෝධිත වර්ෂ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී අධිකාරිය විසින් ඉහත කී පනත යටතේ ප්‍රකාශිත අංක 1159/22 දරන වර්ෂ 2000ක් වූ නොවැම්බර් මස 22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනයේ ආ කොටසේ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු ක්‍රියාකාරකම් ලෙස ප්‍රකාශිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අලුත් කිරීම, අවලංගු කිරීම, ප්‍රතික්ෂේප කිරීම සහ අත්හිටුවීම හා ඊට ආනුෂංගික කරුණු සම්බන්ධව රජ්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත 2001.09.01 දින සිට පවරා ඇති බලතල අද දින සිට මෙයින්, ඉල්ලා අස්කර, ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරමි.

2000ක් වූ අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය වර්ෂ 2009 පෙබරවාරි මස 01 වැනි දින සිට මෙහි පළමු වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රජ්ගම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් මෙයින් බලය පවරමි.

මධ්‍යම පරිසර අධිකාරියේ නියෝගයන්ට, අධීක්ෂණයට හා පාලනයට යටත්ව එකී ජාතික පාරිසරික පනත යටතේ මෙහි 1 වැනි උපලේඛනයේ සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධව සහ එකී ක්‍රියාකාරකම් සම්බන්ධ නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළුව එවැනි බලතල, කාර්ය හා කර්තව්‍ය වලට ආනුෂංගිකව හා සම්බන්ධවන සියලු ක්‍රියාවන් දෙවන උපලේඛනයේ දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුව සභාපති වෙත කර ඇති බලය පැවරුම අනුව එවැනි බලතල, කාර්ය හා කර්තව්‍ය එකී සභාපති විසින් කළ යුතු වේ.

### උපලේඛනය

01. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු).
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්තය.
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල් තෙල් සිඳීමේ කර්මාන්තය.
04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය.
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්.
06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1000කට අඩුවන ඇඹරුම්හල්.
07. දුම්කොළ වේලීමේ කර්මාන්තය
08. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.
09. කෑමට ගන්නා ලූණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත.
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු.
14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
15. සියලු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත.
16. උළු සහ ගඩොල් කර්මාන්ත.
17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු, මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන කැනීම්.
18. දිනකට ඝන මීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත.
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයන් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත.
20. නේවාසික කාමර 5 ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්.
21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනෙකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/ නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ.
22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම,නඩත්තු කිරීම හා සවිකිරීම සිදු කරන ස්ථාන.
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත.
24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථාන.
25. ඊයම් උණු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර.

02-725/12

---

### රජ්ගම ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා අයදුම්පත්/සහතික ගාස්තු පැනවීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ දී තීරණ අංක 09.13 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ගාස්තු ඒ වර්ෂයේ මාර්තු 30 වන දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ලැබී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරීමට හා 2015 ජනවාරි මස සිට ගෙවිය යුතු බවටත්, රජ්ගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

*ජලනල එලීම හා මාර්ග පළුදු කිරීම සඳහා ගාස්තු අය කිරීම*

පහත සඳහන් ගාස්තු 2015.01.01 වැනි දින සිට අය කරනු ලැබේ.

| | රු. ශත. |
|---|---|
| කොන්ක්‍රීට් පාර හරහා කැපීම | 4,200 0 |
| කොන්ක්‍රීට් අයින කැපීම | 1,200 0 |
| මැටි පාර අයින කැපීම | 700 0 |
| තාර පාර හරහා කැපීම | 4,000 0 |
| තාර පාර අයින කැපීම | 1,200 0 |
| කාපට් පාර හරහා කැඩීම | 3,500 0 (දිග මීටර් 1 සඳහා) |
| කාපට් පාර අයින කැපීම | 2,000 0 (වර්ග මීටර් 1 සඳහා) |

* පොදු ජලනල එලීම තෙක් දිග් මීටරයට රු. 60.00

12% වැට් මුදල අය කරනු ලැබේ.

ගලි බවුසරය කුලියට දීම සහා සීමාව තුළ ලීටර් 1800ක බවුසර් ලෝඩ් එකකට අයකිරීම

| | ස්ථානය | 2015 වර්ෂයට ගාස්තුව රු. ශත |
|---|---|---|
| 01. | ආගමික ස්ථාන හා පාසල් සඳහා | 800 0 |
| 02. | නේවාසික ස්ථාන සඳහා | 1,000 0 |
| 03. | රජයේ ආයතන සඳහා | 2,500 0 |
| 04. | වෙළෙඳ ආයතන සඳහා | 2,500 0 |
| 05. | කර්මාන්ත සඳහා | 3,500 0 |
| 06. | සංචාරක හෝටල් සඳහා | 4,000 0 |

(ප්‍රවාහනය සඳහා කි. මී. 1කට රු. 100 0 බැගින් අය කෙරේ.)

සභා සීමාවෙන් පිට - ලීටර් 1000ට බවුසර් ලෝඩ් එකකට අයකිරීම

| | ස්ථානය | 2014 වර්ෂයට ගාස්තුව රු. ශත |
|---|---|---|
| 01. | ආගමික ස්ථාන හා පාසල් සඳහා | 900 0 |
| 02. | නේවාසික ස්ථාන සඳහා | 1,000 0 |
| 03. | රජයේ ආයතන සඳහා | 2,250 0 |
| 04. | වෙළෙඳ ආයතන සඳහා | 2,500 0 |
| 05. | කර්මාන්ත සඳහා | 3,250 0 |
| 06. | සංචාරක හෝටල් සඳහා | 3,750 0 |

(ප්‍රවාහනය සඳහා කි. මී, 1කට රු. 100 0 බැගින් අය කෙරේ.)

(නිවැරදි තොරතුරු සැපයිය යුතු අතර, වැරදි තොරතුරු සැපයීමේ දී ගාස්තු දෙනු නොලැබේ.)

මෙයට අමතරව 12%ක වැට් මුදල අයකරනු ලැබේ.

**2015 වර්ෂයට අයදුම්පත් /සහතික ගාස්තු**

| අනු. අංකය | අයදුම්පත් වර්ගය | 2015 වර්ෂයට ගාස්තුව රු. ශත |
|---|---|---|
| 01. | ගොඩනැගිලි අයදුම්පත් | 300 0 |
| 02. | වීථිරේඛා සහතික ගාස්තු | 300 0 |
| 03. | වරිපනම් නොගෙවන බවට සහතික ගාස්තුව | 200 0 |
| 04. | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය, අංක ලබාගැනීම හා ඇතුළත් කිරීම අයදුම්පත් ගාස්තුව | 250 0 |
| 05. | ජල බවුසරය සඳහා ප්‍රවාහන ගාස්තු (කි. මී. 1 සඳහා) | 100 0 |
| 06. | සුසාන භූමි ආදාහන කටයුතු වෙනුවෙන් | 200 0 |
| 07. | ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමේ පෝර්ම | 200 0 |
| 08. | ක්‍රීඩා පිටි වෙන් කිරීම | 2,000 0 |
| 09. | රගර් | 5,000 0 |
| 10. | අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අයදුම්පත් ගාස්තු | 300 0 |

*අනුකූලතා සහතික ගාස්තු*

| වර්ග ප්‍රමාණය (වර්ග අඩි) | 2015 වර්ෂයට ගාස්තු රු. ශ. |
|---|---|
| 500-750 | 100 |
| 750 -1,000 | 200 |
| 1,000-2,000 | 400 |
| 2,000 ඉහළට | 1,000 |

*පරීක්ෂා කිරීමේ ගාස්තු*

කර්මාන්තයක් හෝ නියමිත කටයුත්තක් සඳහා වන පරීක්ෂා කිරීමේ ගාස්තුව එහි මූලික ප්‍රාග්ධන ආයෝජනය පදනම් කර නිශ්චය කරනු ලැබේ. පහත සටහනේ ලෙස දක්වා ඇති උපරිමයන්ට යටත්ව පරීක්ෂා කිරීමේ ගාස්තුව අයකර ගැනීම නිර්දේශ කරන අතර එවකට අදාළ රජයේ බදු මුදල් අයකර ගත යුතු වේ :-

| | ආයෝජනය (රු.) | පරීක්ෂා කිරීමේ ගාස්තුව (උපරිම) රු. ශ. |
|---|---|---|
| 01. | 250,000 හෝ ඊට අඩු | 3,000 0 |
| 02. | 250,001 - 500,000 | 3,750 0 |
| 03. | 500,001 - 1,000,000 | 5,000 0 |
| 04. | 1,000, 000 ට වැඩි | 10,000 0 |

*2015 වර්ෂයේ දී අයදුම්පත්/පරීක්‍ෂණ සහතික පත් ගාස්තු*

| | අනතුරුදායක ගස් | 2015 වර්ෂයට ගාස්තුව රු. ශත. |
|---|---|---|
| 01. | අයදුම්පත් (පෝර්ම ගාස්තු) | 300 0 |
| 02. | පරීක්ෂණ ගාස්තු | - |
| | (ඒ) 1 පංතියේ දැව (එක් ගසකට) (කොස්, තේක්ක, බුරුත, නැදුන්) | 750 0 |
| | (බී) අනෙකුත් දැව සඳහා එක් ගසකට | 250 0 |

මෙයට අමතරව 12%ක වැට් මුදලක් අයකරනු ලැබේ.

02-725/13

---

## රජ්ගම ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

රජ්ගම ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 29 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ දී ගනු ලැබූ තීරණ අංක 09.01 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ මාර්තු මස 30 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඒ. පී. මනෝජ් මෙන්ඩිස්,
සභාපති,
රජ්ගම ප්‍රාදේශීය සභාව.

2015 ජනවාරි මස 07 වැනි දින,
රජ්ගම,
රජ්ගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ බලපත්‍ර ගාස්තු පිළිබඳ යෝජනාව** (09.01)

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තිය යටතේ රජ්ගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව රජ්ගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත් එකී කර්මාන්ත බලපත්‍ර යටතේ තැනැත්තෙකු 2015 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර රජ්ගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් රජ්ගම ප්‍රාදේශීය සභාව වෙත යෝජනා කරන්නී ය.

I වැනි කොටස - සාමාන්‍ය ව්‍යාපාර

| | *ව්‍යාපාරයේ ස්වභාවය*<br>*කර්මාන්ත හෝ ව්‍යාපාර* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750ට නොවැඩි වන විට*<br>*රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා වන විට*<br>*රු. ශ.* | *ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1501ට වැඩි වන විට*<br>*රු. ශ.* |
|---|---|---|---|---|
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බත්කඩ හෝ ආපනශාලා පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ කඩයක් හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම (ආසන 5ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | තේ කඩයක් හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම (ආසන 1 - 2 දක්වා) | 250 0 | 500 0 | 750 0 |
| 05. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ලැගුම් නිවාස පවත්වාගෙන යාම (කාමර 03ට වැඩි) | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | ගව මස් හැර වෙනත් මස් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම : | | | |
| | (1) දෙනුන් 1-5 ට නොවැඩි වූ විට | 100 0 | 200 0 | 300 0 |
| | (2) දෙනුන් 5-10 ට නොවැඩි වූ විට | 200 0 | 300 0 | 500 0 |
| 11. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ලොන්ඩරි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ශීත කළ මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

1968 අංක 14 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇත්තේ නම් ද, නැතහොත් අනුමත කළ හෝ පිළිගෙන ඇත්තේ නම් අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව වන්නේ එකී ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව අවුරුද්දේ ආදායම අනුව එම ආදායමෙන් 1% ක ගාස්තුවකි.

*අන්තරායදායක කර්මාන්ත ව්‍යාපාර* :

| | | | | |
|---|---|---|---|---|
| 1. | යන්ත්‍රානුසාරයෙන් කබොක්, බොරළු හෝ කළුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | කබොක්, බොරළු හෝ කලුගල් ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | උළු පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ත්‍රීවිලර් සර්විස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මෝටර් සයිකල් සර්විස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| | වෳාපාරයේ ස්වභාවය<br>කර්මාන්ත හෝ වෳාපාර | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා | ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1501 ට වැඩි වන විට |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 7. | ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | යන්ත්‍රානුසාරයෙන් නොවන කබොක්, බොරළු හෝ කලුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීමේ ගබඩාකර තබා ගැනීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අයිස් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ධාන්‍ය හෝ මාංශ භෝග ටොන් 5ක ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ඉන්ධන මගින් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන ලී ඉරුම්මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කම්හලක් පවත්වාගෙන යාම (යන්ත්‍ර නොමැති) | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | අලුත් හෝ පරණ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50ට වැඩි | 500 0 | 750 0 | 1,000 0 |
| | ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සිල්ක් හා කෘත්‍රිම රෙදි විවීම | | | |
| 20. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | අත් බෝර මගින් කළුගල් කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | මීනිරන් ශුද්ධ කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය කිරීම හෝ | 500 0 | 750 0 | 1,000 0 |
| | ගබඩාකර තබා ගැනීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | කුකුළන් 500ට වැඩි ගණනක් සඳහා කුකුළු ගාලක් ඇතුළු කොරටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බැටළුවන්, එළුවන්, හෝ ඌරන් 10ට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | කුකුලන්, කිකිලියන් 100ට වැඩි ගාලක් හෝ කොරටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | සම් භාණ්ඩ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | හම් පදම්කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | පුවක් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | වඩු මඩුවක් හෝ ලී මඩුවක් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ඇසිඩ් වර්ග නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | විනාකිරි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | හුණුගල් හෝ හුණු ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | හුණු පිලිස්සීම හෝ සකස් කිරීම හෝ ගබඩා කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | සෝඩා නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශ, භෝග කෙටීම (වී මෝලක්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | බේකින් පවුඩර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | කළුගල් පිපිරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ඉටිපන්දම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ ස්වභාවය කර්මාන්ත හෝ ව්‍යාපාර | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා | ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1,501 ට වැඩි වන විට |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 44. | බතික් රෙදි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට (කුරුඳු, කරදමුංගු) එනසාල් හෝ දෙහි වර්ග සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | බැටරි චාර්ජ් කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | මෝටර් වාහන අලුත්වැඩියා කිරීම හෝ මෝටර් සර්විස් කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | බෝට්ටු සෑදීමේ හෝ අලුත්වැඩියා කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීමේ හෝ ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | කටුකම්බි නිපදවීමේ හෝ කම්බි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | වායුසමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප්‍රීසර්) නිපදවීමේ සර්විස් කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | යන්ත්‍රෝපකරණ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | රේඩියේටර් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | රබර් දුම් ගැසීමේ දුම් ගෙවල් පවත්වාගෙන යාම හා අත් යන්ත්‍ර මගින් රබර් සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | මිනී පෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | ලියවන පට්ටලයක් භාවිතා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | ෆයිබර් ග්ලාස් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | |
| 62. | සියෙස්ට්‍රා මෙට්ට නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | |
| 63. | ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | නූල් සායම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 550 0 |
| 65. | විදුලි බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | අත්යන්ත්‍ර මගින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කොප්පරා නිෂ්පාදනය කිරීමේ හෝ සකස් කිරීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | ගැලුම් 50ට වැඩි පොල්තෙල් ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 69. | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැළුම් 12ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 70. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හා ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 71. | සත්ව ආහාර හා කුකුළු කෑම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 72. | විවිධ වර්ග විකුණන ස්ථානයක් හෝ ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 |
| 73. | බුලත්, පුවක්, බීඩි, සුරුට්ටු, මැටි භාණ්ඩ, කොහු, ඉදල් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 74. | මාළු කොටුවක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 75. | ස්නැක් බාර් එකක් හෝ කූල් ස්පොට් එකක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 76. | සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 77. | පලා වර්ග විකිණීම | 100 0 | 200 0 | 300 0 |
| 78. | කඩල, රටකජු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |

| ව්‍යාපාරයේ ස්වභාවය කර්මාන්ත හෝ ව්‍යාපාර | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා | ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1,501 ට වැඩි වන විට |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| අප්‍රසන්න වෙළඳාම් : | | | |
| 1. තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 2. දැතින් ලී ඉරන මෝලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. හිරිගල් හෝ හුණුගල් කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් (ග්‍රිල් වැඩ) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. විසිතුරු බඩු පින්තාරු කිරීම සඳහා (ස්ප්‍රේ පේන්ට්) ආයතනයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 6. අත් යන්ත්‍රයක් හැර වෙනත් ක්‍රමයකින් රෙදි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. අත් යන්ත්‍ර ක්‍රමයකින් හැර වෙනත් විධියකින් නූල් කැටීමේ හෝ විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. වර්ග අඩි 50 සිට 500 දක්වා වූ ලෙලි කොරටුවක් සඳහා | | 50 0 | |
| 9. වර්ග අඩි 501 සිට 751 දක්වා වූ ලෙලි කොරටුවක් සඳහා | | 75 0 | |
| 10. වර්ග අඩි 751 සිට 1000 දක්වා වූ ලෙලි කොරටුවක් සඳහා | | 100 0 | |
| 11. වර්ග අඩි 1001 ට සිට 1500 දක්වා වූ ලෙලි කොරටුවක් සඳහා | | 150 0 | |
| 12. වර්ග අඩි 1501 ට වැඩි වූ ලෙලි කොරටුවක් සඳහා | | 200 0 | |
| 13. වර්ග අඩි 2001 ට වැඩි වූ ලෙලි කොරටුවක් සඳහා | | 300 0 | |
| 14. හම් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 15. උම්බලකඩ නිෂ්පාදනය කිරීමේ හෝ ගෝනි 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 16. පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. කරවල, ලුණු, මාළු හෝ ජාඩි හො. 30 ට වඩා වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. මාළු හෝ ජාඩි දැමීම, වේලීම හෝ අයිස් දැමීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 19. සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 20. පුන්නක්කු ටොන් 1ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 21. සත්ව ආහාර හා කුකුළු කෑම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 22. කොන්ක්‍රිට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 23. සිරප් හෝ පළතුරු බීම වර්ග සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. රස කැවිලි වර්ග සාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. රා එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 26. හුණුගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. පැණි නිපදවීම හා ගබඩා කිරීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා ගෝනි 5ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. කෙඳි සායම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 31. පළතුරු මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. යෝගට් හෝ බීම පැකට් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |

| | *ව්‍යාපාරයේ ස්වභාවය කර්මාන්ත හෝ ව්‍යාපාර* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා* | *ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1,501 ට වැඩි වන විට* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 34. | සුවඳ පුයර නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 35. | ගල් නිපදවීම, ඔප දැමීම, ඇඹරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 36. | පාසල් ගල්ලෑලි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 37. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 39. | දියහුණු (වයිටිං) හුණු හෝ හුණුගල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන (බතික්) වැඩපලක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 41. | මෝර වරල් සකස් කිරීම, මිලයට ගැනීම, විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 600 0 | 900 0 |
| 42. | බැටරි චාර්ජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 600 0 |
| 43. | වෑල්ඩින් (ග්‍රිල්) සඳහා වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | අයිස්ක්‍රීම් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 45. | ටයර් හෝ ටියුබ්, වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | බටහිර බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ආයුර්වේද බෙහෙත් වර්ග විකිණීමේ හෝ ප්‍රතිකාර කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | කුරුඳු තෙල් මඩුවක් පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | විකිණීම සඳහා මාළු ඇතිකිරීම හෝ මාළු ටැංකි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 51. | මල් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | තොග වශයෙන් හෝ සිල්ලරට බිත්තර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 500 0 |
| 53. | ඩිස්පෙන්සරියක් (ඉංග්‍රිසි බෙහෙත්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ඩිස්පෙන්සරියක් (ආයුර්වේද සිංහල බෙහෙත්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | ටොන් 1ට වඩා සහල් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ටොන් 1ට වඩා සිමෙන්ති ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| | ටොන් 1ට වඩා පොහොර ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | ටොන් 1ට වඩා පිටි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | මහා පරිමාණයේ ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | මහා පරිමාණයේ ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| | රටකජු පැකට් හෝ බයිට් පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 150 0 | 250 0 | 350 0 |
| 61. | සිමෙන්ති භාණ්ඩ හා ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ (ගඩොල් ග්‍රිල්) නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක් ගිනිපෙට්ටි ගබඩාකර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 100 0 | 200 0 | 300 0 |
| 63. | ඉන්ධන මගින් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | එළවළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | පළතුරු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | කැස්බෑ සංරක්ෂන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | සතුන් සඳහා කුඩු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | දුම් පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ ස්වභාවය කර්මාන්ත හෝ ව්‍යාපාර | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ. | ස්ථානයේ වාර්ෂික . වටිනාකම රු. 1,501 ට වැඩි වන විට රු. ශ. |
|---|---|---|---|---|
| 70. | ප්ලාස්ටික් වෑල්ඩින් වැඩපොළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 71. | වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 75. | ඉස්සන් කොටුවක් පවත්වාගෙන යාම | | | |
| | වර්ග අඩි 100ක් සඳහා | | 500 0 | |
| | වර්ග අඩි 100-500ත් අතර | | 750 0 | |
| | වර්ග අඩි 500ට වැඩි | | 1,000 0 | |

02-725/1

---

**බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව**

වෙනත් ගාස්තු අයකිරීම

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2015 වසර සඳහා පනවා 2015.01.01 සිට අය කිරීමට 2014.11.04 දින විශේෂ සභා රැස්වීමේ දී තීරණය කරන ලද බැව් දැනුම් දෙමි.

ශාස්ත්‍රවේදී උක්වත්තේ චන්දිම හිමි,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.

2014 නොවැම්බර් මස 04 වැනි දින,
ගාල්ල,
කලේගාන,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය 01

| | | රු. ශත |
|---|---|---|
| 01. | ඒ. ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) ගාස්තු | 200 0 |
| 02. | අනතුරුදායක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තු | |
| | 1. කොස් ගසක් සඳහා | 300 0 |
| | 2.වෙනත් ගසක් සඳහා | 100 0 |
| 03. | වරිපනම් සහතික ගාස්තු (වීථි රේඛා සහ නොපරවා ගැනීමේ සහතික ගාස්තු) | 300 0 |
| 04. | ඔප්පු සාරාංශ පත්‍ර ලේඛනයේ ඇතුලත් කිරීම සඳහා | 50 0 |
| 05. | ජල සහතික ගාස්තු විදුලි වෙනත් | 200 0 |
| 06. | වරිපනම් ලේඛනයේ උද්‍ධෘත පිටපත් නිකුත් කිරීම එක් වර්ෂයකට | 25 0 |
| 07. | කේ . පෝරම නැවත නිකුත් කිරීම | 50 0 |
| 08. | සහතික පිටපත් ගාස්තු (එක් වර්ෂයකට සෙවීමේ ගාස්තුව) | 50 0 |
| 09. | රැස්වීම් ශාලාව බදු දීම (එක් දිනකට) | 1,500 0 |
| 10. | ජේ. සී බී. යන්ත්‍රය සේවයේ යෙදවීම (පැයකට) | 2,100 0 |
| 11. | ජලනල එළීම සඳහා පාරවල් පළුදු කිරීමේ ගාස්තු | |
| | 1. එක් පැත්තක 1(m)x1(m) වළක් තැනීමේ දී පමණක් | 1,250 0 |
| | 2. අවම 3(ප)ක නලය එලීමේ දී (0.3(m)x3(m) මාර්ග පළුදු කිරීම සඳහා (තාර සඳහා) | 1,300 0 |
| | කොන්ක්‍රීට් සඳහා | 1,750 0 |
| | 3. වැඩිවන සෑම දික් 1(ප) ක් අයකිරීම (තාර) | 435 0 |
| | අයකිරීම (කොන්ක්‍රීට්) | 600 0 |
| 12. | ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමේදී අවසර ලබාදීමේ ගාස්තු දිනකට | 250 0 |
| 13. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 50 0 |
| 14. | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට | 1 0 |
| 15. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම | 25 0 |
| 16. | ලබුදූව වෙළඳ සංකීර්ණයේ බදු අයිතිය වෙනස් කිරීම | |
| | 1. පහළ කඩ කාමර සඳහා | 1,00,000 0 |
| | 2. ඉහළ කඩ කාමර සඳහා | 50 000 0 |
| 17. | ට්‍රැක්ටරය කුලියට දීම (එක්දිනකට) | 3,000 0 |

02-685

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.